**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය - 2018**

**-------------------------------------------------------------**

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල අතර 2012 ඔක්තෝබර් 08 දින එළඹී අංක 1452පී දරන ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා අදහස් කරනු ලබන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය, වර්ථමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛ ස්ථානයක් හිමිවන මාර්ග ජාල සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පළාත්වල ජාතික මාර්ග කි.මී. 202 ක් වැඩි දියුණු කිරීම සහ පාලම් පළල් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 7,121.32 ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 62.46 ක් වූ අතර ඉන් රු.මිලියන 4,560 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 40 ක් මූල්‍යනය කිරීමට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ඉතිරි රුපියල් මිලියන 2,561.32 කට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 22.46 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කළ යුතුය. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවත් මෙම ව්‍යාපෘතිය නිම කිරීමේ දිනය අවස්ථා දෙකකදී 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

**------**

2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**--------------------**

මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්ධ නිසි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්. ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වූ වන්දි වෙනුවෙන් ප්‍රමාද පොළී ලෙස රු. මිලියන 21 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. තවද 2018 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීම ප්‍රමාද වීම මත ගෙවීමට සිදුවන පොළී වෙනුවෙන් ගිණුම්වලට වැරදියට රු. මිලියන 3 ක අධිප්‍රතිපාදන සලසා තිබුණි. | වත්කම් සහ වගකීම් රු.මිලියන 3 කින් වැඩියෙන් දැක්වීම. | වරද නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | ගිණුම් නිවැරදි කිරීම සඳහා යොදන පාලනයන් ශක්තිමත් කළ යුතුය. |

## 03. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ මූලික සැලැස්ම අනුව ජාතික මාර්ග කි.මී. 202 ක් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීමට ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කර තිබුණි. නමුත් 2012 මැයි 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයක් ප්‍රකාර පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමට අපේක්ෂිත ජාතික මාර්ගවල දිග කි.මී. 64 ක් දක්වා අඩු කිරීමට තීරණය කර තිබුණි. මෙම මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම් අදියර 04 ට අයත් කි.මී. 36.57 ක ජාතික මාර්ග සහ පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ පාලම වැඩි දියුණු කිරීමට අදාල ඉදිකිරීම් කටයුතු පමණක් 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 අගෝස්තු 24 දිනට වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබූ පේරාදෙණිය, බදුල්ල සහ චෙන්කලාඩි මාර්ගයේ කි.මී. 0+420 කොටස සිට කි.මී. 3+050 කොටසේ ඉදිකිරීම් කටයුතු එදින වන විට සියයට 27.37 ක මන්දගාමී ප්‍රගතියක් පමණක් අත්පත් කර ගෙන තිබුණි. කෙසේ වුවද මෙම කොන්ත්‍රාත්කරු අදාල පාර්ශවයන්ගෙන් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතියක් ලබා ගැනීමකින් තොරව 2019 අප්‍රේල් 30 දින දක්වා අඛණ්ඩව ඉදිකිරීම් කටයුතු සිදුකර ගොස් තිබූ අතර එදින භෞතික ප්‍රගතිය සියයට 38.13 ක් විය. | ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යාමේ හැකියාවක් පැවතීම. | විධිමත් පරිදි පිළිතුරු ලබා දී නැත. | පිරිවැය ඉහළ යාම හා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම වළක්වාලමින් ඉලක්කගත කාලයේ අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීමට කොන්ත්‍රාත්කරුවන්ට බලපෑම් කළ යුතුය. |